සංස්කරණය - වසන්ත ලියනගේ දිවයින 2014 මාර්තු මස 11 වැනිදා අඟහරුවාදා



# විසිදැල





# ඩොල්ෆින් මසුන්ගේ මනරම් නැටුම් දුටුවෙමු

අලි බැලිල්ලයි බලි බැලිල්ලයි එපා නොවන බව අපි අසා ඇත්තෙමු. බලි කෙසේ වෙතත් අපි අලි නම් දැක ඇත්තෙමු. ඇත්තටම අලි දිහා කොතෙක් වේලා බලා සිටියත් අලින්ගේ ක්‍රියාකාරකම්වලින් අප නෙත් ඈතට ගැනීමට සිත නොදෙයි.

අප අලි දකින්නේ ගොඩබිමේය. එහෙත් ගොඩබිමින් ඈත මුහුදේදී ඩොල්පින්ලාගේ ක්‍රියාකාරකම් දුටු අපට අලි වගේම ඩොල්පින්ලා බැලීමත් එපා නොවන දසුනක් බව පසක් විය.

ඩොල්පින්ලාගේ මේ අනඟ රැඟුම් අපට දැක බලාගැනීමට පසුගියදා කල්පිටිය නොරොච්චෝල මුහුදු තීරයේදී හැකිවිය. පොදුවේ ගත්තද කල්පිටිය මුහුදු කලාපය සැලකෙනුයේ ඩොල්පින්ලාගේ පාරාදීසයක් ලෙසිනි. ඒ අතර කල්පිටිය නොරොච්චෝලේ මුහුදු කලාපය යනු ඩොල්පින්ලාගේ ක්‍රියාකාරකම් රිපිසේ දැක බලා ගැනීමට හැකි මුහුදු විශේෂ කලාපයක් ලෙස හඳුන්වාදීම වරදක් නොවන බව එම මුහුදු කලාපයේ සංචාරයක නිරත වූ අපට පසක් විය.

මෙම සංචාරයට අපට මඟපෙන්වීම් කරනු ලැබුයේ නොරොච්චෝලේ ඉලන්තිඅඩිය ඔමීෂා බීච් හෝටලයේ (OMEESHA BEACH HOTEL) අධිපති කීර්ති සම්පත් පීරිස් මහතායි.

සම්පත් පීරිස් මහතා අපට ලබාදුන් නියමුවකුගේ මඟපෙන්වීම් යටතේ අප මාධ්‍ය කණ්ඩායමට කල්පිටිය මුහුදු කලාපයේදී ඩොල්ෆින් මසුන් බලා ගැනීමට ගිය ගමනේදී අපට නෙත ගැටුණු දසුන මනරම්ය. එක යායට පීණමින් කරණම් ගසමින් අපූරු දසුන් මවනා දහස් ගණනක ඩොල්ෆින් මසුන්ගේ ක්‍රියාකාරකම් අපගේ නෙතට රසඳුනක්ම විය.

අප ඩොල්ෆින් මසුන් බලා ගැනීමට ගිය අවස්ථාවේදී එම ස්ථානයේදී බෝට්ටු කීපයක පැමිණි දේශීය මෙන්ම විදේශීය සංචාරකයන් දැකගැනීමට හැකිය. කුඩා ගුවන් යානයක පැමිණි පිරිසක් එම අවස්ථා වීඩියෝ ගත කරන අයුරු ද දැකගැනීමට හැකිවිය.

ඩොල්ෆින් මසුන් ගැන අප කොතෙකුත් දේ අසා ඇත්තෙමු. එහෙත් ඩොල්ෆින් මසුන්ගේ සැබෑ ක්‍රියාකාරකම් දෑසින්ම බලාගැනීමට ලැබූ එම හෝරා කීපය අපට ජීවිතයේ ලැබූ තවත් අපූර්ව අත්දැකීමක්ම විය. එක යායට පීනන ඩොල්ෆින් මසුන් අතරේ කරනම් ගසා ආපසු මුහුදට වැටෙන ඩොල්පින් මසුන්ගේ දර්ශනය අපගේ මතකයෙන් ගිලී නොයනු ඇත.

ඩොල්පින් මසුන් බලා ගැනීමට යන සෑම අයකුටම ආරක්ෂිත කබා අනිවාර්ය විය. බෝට්ටුවේ ධාරිතාවයට සරිලන ප්‍රමාණයක් ගෙනයෑම ද අනිවාර්ය කාරණයක් බව සම්පත් පීරිස් මහතා අප සමඟ පැවසුවේය.

"ඩොල්පින් මසුන් බලන්න යන සියලු දෙනාටම ආරක්ෂිත කබා අප ලබාදෙනවා. අපට ඔවුනගේ ජීවිත පිළිබඳ විශාල වගකීමක් තියෙන නිසා ආරක්ෂිත කබා නොපළඳින කිසිවකු අප මේ ගමනට එකතු කර ගන්නේ නැහැ. ඒ වගේම බෝට්ටුවේ ධාරිතාවට සරිලන ප්‍රමාණය පමණයි අප ඊට නංවා ගන්නේ.

මෙහිදී මා මතක් කළ යුතු විශේෂ කාරණයක් තියෙනවා. කල්පිටියේ නොරොච්චෝල කියන්නේ ඉතා පහසුවෙන් ඉතාමත් කෙටි කාලයක් තුළ ඩොල්පින් සතුන් දැක බලා ගැනීමට හැකි ස්ථාන ලෙස හඳුන්වන්න පුළුවන්. මෙම ප්‍රදේශයේ මුහුදු වෙරළේ සිට විනාඩි 20 ක් වැනි සුළු කාලයක් තුළ ඩොල්පින් මසුන් ගැවසෙන ස්ථානයට ළඟාවෙන්න පුළුවන්. ඊට හේතු වී තිබෙන්නේ මුහුදු වෙරළේ සිට ඩොල්පින් මසුන් ගැවසෙන මුහුදු කලාපය ඇත්තේ කිලෝමීටර් 4 ක් වැනි දුරක් පමණක් වීමයි. මුහුදු වෙරළට ආසන්නව ගැඹුරු මුහුදු ක්ලාපයක් මෙහි නිර්මාණය වීම නිසා ඩොල්ෆින් මසුන් මෙහි නිතරම සුලබව ගැවසෙනවා. එනිසා ඩොල්පින් මසුන් දැකබලා ගැනීමට එන පිරිස මෙම මුහුදු කලාපය විශේෂ මුහුදු කලාපය ලෙස හඳුන්වා දෙන්න පුළුවන්.

වසන්ත ලියනගේ
ඡායාරූප- සජිත් ජයසේකර

